**වැලිකන්ද ප්‍රාදේශීය සභාව**

**පොළොන්නරුව දිස්ත්‍රික්කය**

**-----------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන.**

**-----------------**

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

---------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 අප්‍රේල් 08 දිනද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 ජුනි 03 දිනද විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2015 ජුලි 30 දින සභාවේ සභාපතිවරයා වෙත යවන ලදී.

1.2 මතය.

---------

මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට වැලිකන්ද ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂයට සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

-------------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු.

-------------------------

පහත සඳහන් ගණකාධිකරණ අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(i) සමාලෝචිත වර්ෂයේ සභා නිලධාරියෙකුට ගෙවිය යුතු හිඟ වැටුප් රු. 25,000 ක්, ණයහිමියන් යටතේ දක්වා නොතිබුණි.

(ii) මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දැක්විය යුතු මූල්‍ය අත්පත්කර ගැනීම් හා ඉවත්කිරීම් වටිනාකම රු. 211,412,682 ක් වුවද, එම වටිනාකම රු. 15,080,011 ක් වශයෙන් සදොස් ලෙසද, සාමාන්‍ය මෙහෙයුම් වලින් ලද ඌණතාවය රු. 4,084,286 ක් වුවද, එය රු. 1,933,043 ක් ලෙසද සදොස්ව දක්වා තිබීමෙන්, ඉදිරිපත් කර ඇති මුදල් ප්‍රවාහ ප්‍රකාශය මගින් නිරවද්‍ය තොරතුරු ඉදිරිපත් වී නොතිබුණි.

1.3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම.

---------------------------------------

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොවීම නිසා එකතුව රු.238,230,118 ක් වූ ගණුදෙනු විගණයේදී සතුටුදායක ලෙස සන්නිරික්ෂණය කිරීමට නොහැකි විය.

**02. මූල්‍ය සමාලෝචනය.**

**--------------------------**

2.1 මූල්‍ය ප්‍රතිඵල

--------------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු. 4,084,286 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු. 145,832 ක් වුයෙන්, ඉකුත් වර්ෂය හා සැසඳීමේදී මූල්‍ය ප්‍රතිඵලයේ රු. 3,938,454 ක පිරිහීමක් නිරික්ෂණය විය.

2.2 ආදායම් පරිපාලනය.

-----------------------

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිග ආදායම්.

---------------------------------------------------------------

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත ආදායම් | තථ්‍ය ආදායම | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු. '000 | රු. '000 | රු. '000 |
| (i) වරිපනම් හා බදු | 750 | 320 | - |
| (ii) බදු කුලී | 6,125 | 2,124 | 852 |
| (iii) බලපත්‍ර ගාස්තු | 1,122 | 222 | 477 |
| (iv) වෙනත් ආදායම් | 16,062 | 10,325 | 3,360 |

3. මෙහෙයුම් සමාලෝචනය

---------------------------------

3.1 නිෂ්ක්‍රීය හා ඌණ උපයෝජිත වත්කම්

----------------------------------------

(අ) සභාව සතුව තිබුණු වටිනාකම රු. 613,500 ක් වූ සහල් පිටි හා සහල් පිටි ආශ්‍රිත නිෂ්පාදන සෑදීමේ උපකරණ කට්ටලය වසර 5 කට අධික කාලයක සිට කිසිදු ප්‍රයෝජනයකට නොගෙන නිශ්කාර්යව පවැතුණි.

(ආ) සභාව සතුව පවතින රෝද හතරේ ට්‍රැක්ටර් රථ 2ක් සහ රෝද දෙකේ අත් ට්‍රැක්ටරයක් වසර 03 කට අධික කාලයක සිට භාවිතයට නොගෙන සහා භූමියේ රඳවා ගෙන තිබුණි.

3.2 මෙහෙයුම් හා කළමනාකරණ අකාර්යක්ෂමතා

---------------------------------------------------

(අ) සභාව විසින් සමාලෝචිත වර්ෂයේදී ගෙවීම් කිරීම පිණිස ලියන ලද රු. 6,048,500 ක වටිනාකමකින් යුතු චෙක්පත් 47 ක් අවලංගු කර ඇති බව නිරික්ෂණය වූ අතර ඊට පැහැදිළි හේතුවක් අනාවරණය නොවීය. එම චෙක්පත් වලින් රු. 5,398,030 ක් වටිනා චෙක්පත් 10 ක්, සමාලෝචිත වර්ෂයේ ව්‍යාපෘති සඳහා ගෙවිය යුතු චෙක්පත් විය.

(ආ) හිඟහිටි වෙනත් ආදායම් යටතේ දක්වා ඇති රු. 436,695 ක් වූ හිඟ ශේෂ 7 ක් අයකර ගැනීම සඳහා ප්‍රමාණවත් පියවර සභාව විසින් අනුගමනය කර නොතිබුණි.

3.3 කිරි ගවයන් මිලදී ගැනිම

------------------------------

(අ) 2013 අයවැය යෝජනාවක් අනුව පළාත්වල දිළිඳුකම අවම කිරීමේ සංවර්ධන වැඩසටහන යටතේ උතුරු මැද පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් වැන්දඹු කාන්තාවන් සඳහා කිරි ගවයින් ලබාදීමේ වැඩසටහනක් සඳහා රු. 2,000,000 ක ප්‍රතිපාදනයක් සභාව වෙත ලබාදී තිබුණි. අදාල වැඩසටහන සඳහා කිරි ගවයින් සැපයීම සඳහා පොළොන්නරුව දිස්ත්‍රික්කයේ රජයේ සත්ව ගොවිපල මගින් විමසීම් නොකර, පෞද්ගලික සැපයුම්කරුවකුගේ මිල ගණන් මත කිරි ගවයන් 33 දෙනෙකු රු.1,980,000 ක මුදලකට මිලදිගෙන වැන්දඹු කාන්තාවන් 33 දෙනෙකු වෙත බෙදා දි තිබුණි. වැන්දඹු කාන්තාවන් 33 දෙනෙකු තෝරාගැනීමට ආදල කිසිදු ලිඛිත සාක්ෂියක් නොතිබීමත්, අදාල ප්‍රතිලාභීන් කිරි ගවයින් ලබාගත් බවට අත්සන් පත්‍රිකාවක් මගින් තහවුරු නොවීමත් සහ එම වැඩසටහන සාර්ථකව ක්‍රියාත්මක වන්නේද යන්න පිළිබඳ පසුවිපරම් ක්‍රියාවලියක් සභාව විසින් ක්‍රියාත්මක කර නොමැතිවීමත් නිරික්ෂණය විය.

(ආ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.4 වගන්තියේ විධිවිධාන අනුව සභාව සඳහා ප්‍රසම්පාදන කමිටුවක් පත්කළ යුතු වුවත්, වැලිකන්ද ප්‍රාදේශීය සභාව සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන කමිටුවක් පත්කර, එහි සාමාජිකයින් නම්කර නොතිබුණි.

3.4 අයවැය පාලනය

--------------------

ප්‍රාදේශීය සභාව සතු ආදායම් ප්‍රභවයන් නිසි ලෙස පුරෝකථනයකින් තොරව ඇස්තමේන්තු සකස්කිරීම හේතුවෙන්, සමාලෝචිත වර්ෂයේ තථ්‍ය ආදායම හා ඇස්තමේන්තුගත ආදායම් විෂයයන් අතර සියයට 25 සිට සියයට 81 දක්වා විචලනයක් නිරික්ෂණය විය.

3.5 ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය

-----------------------------------

සමාලෝචිත වර්ෂයේදී වැලිකන්ද ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ කසල කළමනාකරණ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබුණු අතර ප්‍රදේශයේ රැස්කරන කසල අවිධිමත්ව කැලෑබද ප්‍රදේශයකට බැහැරකිරීමට කටයුතු කර තිබුණි.

3.6 අභ්‍යන්තර විගණනය

------------------------

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂයන්හි සභාව තුළ අභ්‍යන්තර විගණනයක් සිදුවී නොතිබුණු අතර පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින්ද ප්‍රමාණවත් විගණනයක් ප්‍රාදේශීය සභාව තුළ ක්‍රියාත්මක කර නොතිබුණි.

4. පද්ධති හා පාලන

--------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) අයවැය පාලනය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) වත්කම් කළමනාකරණය